# බහුශ්‍රේණි ඉගැන්වීම සඳහා වූ
# විශේෂ ගුරු සේවා අවශ්‍යතා
# පිළිබඳ අධ්‍යයනයක්

(වතු සහ ග්‍රාමීය පාසල් ඇසුරින්)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවට නියමිත

පර්යේෂණ ග්‍රන්ථය

AP/5/2002/M Phil - 02

ඩබ්. ඒ. විමලසේන
ශාස්ත්‍රවේදී (පේරාදෙනිය)
ශාස්ත්‍රපති (පාලි බෞද්ධ විශ්ව විද්‍යාලය)
විද්‍යාපීඨ පුහුණු උපාධි
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට සම්මාන)
(කොළඹ විශ්ව විද්‍යාලය)

UCLIB
554688

අධ්‍යාපන පීඨය
කොළඹ විශ්ව විද්‍යාලය
2010 සැප්තැම්බර්

## සාරාංශය

ශ්‍රී ලංකාවේ පාසැල් පද්ධතිය තුළ පාසැල් අතර ඇඩි විෂමතා පවතින බව පෙනී යයි. සැමට අධ්‍යාපනය නැමති සංකල්පය යටතේ මෙම අසමානතාව මගහැරීමට උත්සාහ ගෙන ඇත. එහෙත් සම්පත් බෙදාහැරීමේ විෂමතා සහ ගුරු පුහුණුව, ගුරුවරුන් බෙදාහැරීම, වැනි ප්‍රාදේශීය විෂමතා නිසා අධ්‍යතයේ ගුණාත්මකභාවය සම්බන්ධ ගැටලු පවතින බව ජයවීර (1997) වාර්තාවෙන් ප්‍රකාශ වේ. ලංකාවේ පාසැල් පද්ධතිය තුළ පාසැල් වැඩි ප්‍රමාණයක් ගම්බදව සහ ග්‍රාමීය වතු ආශ්‍රිතවද, දුෂ්කර ප්‍රදේශවලද පිහිටා ඇත. ගුරු හිඟය, ගුරු නොපැමිනීම්, සහ ගුරු නිවාඩු ගැනීම් බහුලව සිදුවේ.. එම තත්ත්වය මත බහුශ්‍රේණි ක්‍රමයට ඉගැන්වීමේ අවශ්‍යතාවය පැනනගින බව පෙනී යයි. බහුශ්‍රේණි ඉගැන්වීම් ඇතිවීමට ගුරුවරුන් ස්ථාපනය, ගුරු හිඟය සහ ගුරුවරුන් නොපැමිණීම මෙන්ම භූගෝලීය සමාජ ආර්ථික හේතුද බලපාන බව පෙනී යයි. ඒ අනුව බහුශ්‍රේණි ඉගැන්වීම සඳහා වූ ගුරු සේවා අවශ්‍යතා යන පර්යේෂණයේ මූලික අරමුණ අතර බහුශ්‍රේණි ඉගැන්වීම් පිළිබඳ තත්ව විමර්ශනය, බහුශ්‍රේණි ඉගැන්වීම්, ගුරු පුහුණුව හා සූදානම සහ බහුශ්‍රේණි ක්‍රමයට ගැනෙන ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ අදහස් විමසීම මූලික අවශ්‍යතාවක් විය. ඒ සඳහා කැගල්ල, රත්නපුර යන අධ්‍යාපන පරිපාලන දිස්ත්‍රික්ක දෙක තුළ බහුශ්‍රේණි පාසැල් 30 ක විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් 100 ක නියදියක් යොදාගන්නා ලදී. එම අරමුණ ඉටුකර ගැනීම සඳහා ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා පෙඩූල සහ නිරීක්ෂණ පත්‍රිකා උපයෝගී කර ගැනිනි. ඒ අනුව දත්ත විශ්ලේෂණය කිරීමේදී බහුශ්‍රේණි ඉගනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සම්බන්ධ වැදගත් නිගමන හා නිර්දේශ ලබාගත හැකි විය. විශේෂයෙන්ම බහුශ්‍රේණි පාසැල්වල පිහිටීම හා ස්වභාවය, අනුව පාසල් සම්බන්ධ සුවිශේෂී කරුණු රාශියක් අනාවරණය කරගත හැකිවය. ඒ අතර බහුශ්‍රේණි පාසැල් බහුතරයක් ඉතා දුෂ්කර බැහැර කටුක ප්‍රදේශවල පිහිටා ඇති පාසැල් බවත්, එසේම ගමනාගමන පහසුකම් සහ අනෙකුත් යටිතල පහසුකම් නොමැති පාසැලි විශාල ගණනක් පවතින බවත් අනාවරණය විය. තවද එබඳු පාසැල්වල මූලික ගැටලු ගණනාවක් පවතින අතර ඉන් ගුරු හිඟය, සහ ගුරුවරුන් එදිනෙදා සේවයට නොපැමිණීම් ප්‍රමුඛ වන බවත් පෙනී ගියේය.

තවද බහුශ්‍රේණි පාසැල්වල මූලික විෂයවලට මෙන්ම අනෙකුත් විෂය සඳහාද ඉගැන්වීම මහත් අසීරුවෙන් සිදුකරනු ලබන බවද නිගමනය කළ හැකි විය. භෞතික සහ මානව සම්පත් හිඟය ප්‍රබල ගැටලුවක් වන අතරම බහුතරයක් පාසැල්වල බහුශ්‍රේණි ඉගැන්වීම දිගුකාලීනව සිදු කරන ක්‍රියාවලියක් බවද නිගමනය කළ හැකි විය. එබඳු පාසැල්වල ගුරුවරුන්ගේ ඉගනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පවතින දුර්වලතා සහ ගැටලු ගණනාවක් පර්යේෂණයේදී අනාවරණය විය. බහුශ්‍රේණි ඉගැන්වීම්, පෙර පුහුණුව, පන්ති කළමණාකරණය, පාඩම් සටහන් හා වාර සටහන් ලිවීම, පෙළපොත් හා ගුරු අත්පොත් ලැබීම සම්බන්ධ මූලික ගැටලු පවතින බව පෙනී ගියේය. බහුතරයක් පාසැල්වල ගුරුවරුන්ට බහුශ්‍රේණි සම්බන්ධ අත්දැකීම් හා පුහුණුව නොමැති බව විශේෂයෙන්ම අනාවරණය වූ කරුණක් විය. විශේෂයෙන්ම බහුශ්‍රේණි පාසැල්වල විදුහල්පතිවරුන්ද බහුශ්‍රේණි ඉගැන්වීම් සම්බන්ධයෙන් සෘණාත්මක ආකල්ප දරණ බව තහවුරු විය. ඒ අනුව බහුශ්‍රේණි පාසැල් කළමණාකරණයේදී විවිධ ගැටලුවලට මුහුණපාන්නට සිදුවන අතර ඒවා මූලික වශයෙන් බහුශ්‍රේණි ක්‍රමයට ඉගැන්වීමේ ගැටලු බව පෙනී ගියේය. ගුරුවරුන් යොමුකිරීම, බහුශ්‍රේණි සම්බන්ධ පුහුණු අවස්ථා නොලැබීම, ඒ සම්බන්ධ අත්දැකීම් අඩු ගුරුවරුන් යෙදවීමට සිදුවීම යනාදී කරුණු විදුහල්පතිවරුන්ගේ මූලික ගැටළු බව දත්ත විශ්ලේෂණයේදී නිගමනය විය. තවද දුෂ්කර සහ අවාසිදායක ප්‍රදේශවල පිහිටි පාසැල්වල ගුරුවරුන් සම්බන්ධව විශේෂ නිර්දේශ ගණනාවක්ද මෙහිදී ඉදිරිපත් කරන ලද්දේය.

ඒ අනුව බහුශ්‍රේණි ඉගැන්වීම්වලට අදාල විශේෂ ගුරු සේවා අවශ්‍යතා වූ නිර්දේශ අතර මූලික වශයෙන් එවැනි බහුශ්‍රේණි ඉගැන්වීම් හා සම්බන්ධ ගුරු පිරිසකගේ අවශ්‍යතා අවධාරණය විය. එමෙන්ම හඳුනාගන්නා ලද දුෂ්කර සහ ග්‍රාමීය ප්‍රදේශවලට බහුශ්‍රේණි ගුරු පුහුණුව ලැබූ ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් පත්කිරීම සුදුසු බවද නිර්දේශ විය. විශේෂයෙන්ම බහුශ්‍රේණි ඉගැන්වීම, සම්බන්ධ ගුරු පුහුණුව සහ එවැනි අඛණ්ඩ ගුරු පුහුණු වැඩසටහන් ජාතික මට්ටමින් දියත් කිරීම සුදුසු බවද පෙනී ගියේය. විශේෂයෙන්ම ජාතික ගුරු අධ්‍යාපන වැඩසටහන් තුළ බහුශ්‍රේණි ඉගැන්වීම් සම්බන්ධව ගුරු පුහුණුව ලබාදීම පළාත්බද අධිකාරිය මගින් හඳුනාගන්නා ලද ප්‍රදේශවල ගුරුවරුන් සහ ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම වැනි ජාතික මට්ටමේ වැඩසටහන් තුළින් බහුශ්‍රේණි ක්‍රමයට ඉගැන්වීම ප්‍රවර්ධනය කිරීම සඳහා යොදාගත හැකි වැඩසටහන්ද මෙහිලා නිර්දේශ කර ඇත.